# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2015

## Primary Piriven Mid Year Term Test - 2015

4 වසර / Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ත්‍රිපිටක ධර්මය**
**Tripitaka Dharmaya**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලටමත් II, III, හා IV කොටස් වලින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත්වන සේ ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. **කෙටි පිළිතුරු සපයන්න.**

i) අනුත්තර පුරිසදම්ම සාරථී ගුණයට උදාහරණ 04 ක් නම් කරන්න.
ii) සතර සතිපට්ඨානය නම් කරන්න.
iii) නියාම ධර්ම කොතෙක් ද? නම් කරන්න.
iv) ආර්ය ධන සතකි. නම් කරන්න.
v) සතර බ්‍රහ්මවිහාර සඳහන් කරන්න.
vi) ප්‍රධාන සීමා වර්ග දෙකකි. ඒවා නම් කරන්න.
vii) ප්‍රථම සංගායනාවේ ප්‍රධානත්වය, දායකත්වය හා පැවැත්වූ ස්ථානය සඳහන් කරන්න.
viii) චෛතසිකවල ප්‍රධාන බෙදීම් 03 නම් කරන්න.
ix) පිප්ඵලී මාණවකයාගේ ස්වාමිදියණියගේ නම කුමක් ද?
x) චරණ ධර්ම අතරින් 08 ක් නම් කරන්න. (ලකුණු4x10= 40)

## II කොටස

02. **පහත සඳහන් ගාථා වලින් 03 ක් සම්පූර්ණ කර ගාථා දෙකක අදහස ලියන්න.**

i) යාව දෙව අනත්ථාය......
ii) මධුවා මඤ්ඤති බාලො......
iii) න තං කම්මං කතං සාධු .....
iv) පුත්තාමත්ථි ධනම්මත්ථි......
v) යාවජීවම්පි චෙ බාලො......

(ලකුණු3x5= 15)

03. i) අෂ්ට විද්‍යා නම් කරන්න.
ii) ''සුගත'' බුදුගුණය පැහැදිලි කරන්න. (ලකුණු8 +7 =15)

## III කොටස

04. i) කර්මය හඳුන්වන පාඨය ලියන්න
ii) කෘත්‍ය වශයෙන් කර්මය සිව් ආකාර වේ. නම් කරන්න.
iii) 'ගරුක කර්ම'' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 3 +4+8=15)

05. i) අංගුත්තර නිකායේ නිපාත කොතෙක් ද?

ii) ''නව සුත්ත සහස්සානි'' ගාථාව සම්පූර්ණ කරන්න.

iii) සාරණීය ධර්ම කරුණු පැවිදි දිවිය සමගියෙන් ගත කිරීමට කෙතරම් ඉවහල්වේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 3 +4+8=15)

06. i) දස අකැප වස්තු නම් කරන්න.

ii) ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න. (ලකුණු8 +7 =15)

07. මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ශාසනික සේවය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 15)

## Iv කොටස

08. i) දශවිධ පලිබෝධ නම් කරන්න.

ii) කසිණ භාවනාව වඩන අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු8 +7 =15)

09. i) චෛතසික හඳුනාගැනීමේ ලක්‍ෂණ 04 සඳහන් කරන්න

ii) අඤ්ඤ සමාන චෛතසික ඒ නමින් හඳුන්වන හේතුව පහදන්න

(ලකුණු 8+7=15)

10. i) පාතිමොක්ඛ යන පදය විවරණය කරන්න

ii) පුබ්බ කරණ හඳුන්වන්න

iii) සම්පජාන මුසාවාදය සිදුවන්නේ කෙසේ ද? (ලකුණු 4+4+7=15)